# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.11. 14 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03-2016(II)**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 හා 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016(I) ට අතිරේක වශයෙනි.

02.එම ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 නිකුත් කර ඇත්තේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 පදනම් කර ගෙනය.

03. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2018.07.09 දිනැතිව නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 මගින් ප්‍රසම්පාදන කමිටු සීමාවන් කිහිපයක් සංශෝධනය කර ඇත.එම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 පදනම් කර ගෙන පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ රීති 422 සංශෝධනය කළ ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 හි සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමාවන් පහත පරිදි සංශෝධනය කර දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2018.09.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 822 මගින් ගරු අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති අතර, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/6/3/8 හා 2018.11.05 දිනැති ලිපිය මගින් ලැබී ඇත.

භාණ්ඩ,වැඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරගකාරී ලංසු කැඳවීමේ පරිපාටිය(ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1, 3.2 හෝ 3.3 ) ඍජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ 3.5 හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීම.

| බල අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්ගත කොන්ත්‍රාත්තු | |
|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200 ට වැඩි | රු.මිලියන 250 ට වැඩි |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා | රු.මිලියන 200 ට වැඩි | රු.මිලියන 250 ට වැඩි |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200 දක්වා | රු.මිලියන 250 දක්වා |


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා | රු.මිලියන 200 දක්වා | රු.මිලියන 250 දක්වා |

422.1 ආ.- භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4)

1. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත්තු සඳහා පහත සඳහන් අය වෙතින් මිළ ගණන් කැඳවිය හැකිය.

(අ) ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් (ප්‍රකට වෙළඳුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම්)

(ආ) ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි සැපයුම්කරුවන් (අදාළ වේ නම්)

2. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජාපාදක සංවිධානද ඇතුළු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිළ ගණන් කැඳවිය හැකිය.

අදාළ අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛන භාවිතා කළ යුතුය. එසේම කලින් දැනුම් දුන් දිනක ලංසු භාර ගැනීම අවසන් කළ යුතු අතර එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කළ යුතුය.

| බල අධිකාරිය | විදේශ අරමුදල්ගත කොන්ත්‍රාත්තු | |
|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ (ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 2 දක්වා | රු.මිලියන 3.5 දක්වා |

04.එබැවින් ඉහත සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමා අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලෙසත්, එහි සඳහන් නියමයන් හා උපදෙස් පිළිපදින ලෙසත්, කාරුණිකව දන්වමි. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දැනුම්දෙමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් - 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත :- දැ.ගැ.ස.
02.අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත :- දැ.ගැ.ස.
03.ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත :- දැ.ගැ.ස.

# දකුණු පළාත් සභාව
## අමාත්‍ය මණ්ඩල තීරණ

<u>අතිශයින්ම රහසිගතයි</u>

ප්‍රධාන අමාත්‍යාංශය,
5 වන මහළ,
දක්ෂිණාපාය,
ලබුදූව,ගාල්ල.
2018 සැප්තැම්බර් 19 වන දින

DCS/F/P/Eng.
D/Ac.P./F/B/Aud./C.Acc./Acc(Sup.)
Pl. take action / Pl. speak

Chief Secretary (S.P.)

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**2018.09.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරන ලද වෙනත් කරුණු වලට අදාල තීරණ ක්‍රියාත්මක කිරීම.(822)**

2018.09.12 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණ පහත සඳහන් කරමි.

01. දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/7/1/52(වෙළුම II) හා 2018.08.08 දිනැතිව ඉදිරිපත් කරන ලද "ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම" යන මැයෙන් වූ වාර්තාව ගරු අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලදි.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2016.05.25 දිනැති පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ අංක 737 මගින් ලබාදුන් අනුමැතිය හා ඒ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි 2016.08.24 දිනැතිව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් චක්‍රලේඛ(මුදල්) 03/2016 චක්‍රලේඛයට අතිරේක වශයෙනි. එම ප්‍රධාන ලේකම් චක්‍රලේඛ(මුදල්) 03/2016 නිකුත් කර ඇත්තේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 පදනම් කර ගෙනය.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2018.07.09 දිනැතිව නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 මගින් ප්‍රසම්පාදන කමිටු සීමාවන් කිහිපයක් සංශෝධනය කර ඇත. එම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 පදනම් කර ගෙන පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ රීති 422 සංශෝධනය කල ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 හි සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමාවන් පහත පරිදි සංශෝධනය කර දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ගරු අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී.

භාණ්ඩ, වැඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ පරිපාටිය (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1, 3.2 හෝ 3.3) සෘජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ 3.5) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීම.

| බල අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්ගත කොන්ත්‍රාත්තු | |
|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200ට වැඩි | රු.මිලියන 250ට වැඩි |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා | රු.මිලියන 200ට වැඩි | රු.මිලියන 250ට වැඩි |

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200 දක්වා | රු.මිලියන 250 දක්වා |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා | රු.මිලියන 200 දක්වා | රු.මිලියන 250 දක්වා |

422.1 ආ. - භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (මාර්ගෝපදේශ 3.4)

1. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත්තු සඳහා පහත සඳහන් අය වෙතින් මිල ගණන් කැඳවිය හැකිය.
(අ) ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් (ප්‍රකට වෙළඳුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම්)
(ආ) ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි අයදුම්කරුවන් (අදාළ වේ නම්)

2. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජාපාදක සංවිධානද ඇතුළු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවිය හැකිය.

අදාළ අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛන භාවිතා කල යුතුය. එසේම කලින් දැනුම් දුන් දිනක ලංසු භාර ගැනීම අවසන් කල යුතු අතර එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කල යුතුය.

| බල අධිකාරිය | විදේශ අරමුදල්ගත කොන්ත්‍රාත්තු | |
|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ (ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 5ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 2 දක්වා | රු.මිලියන 3.5 දක්වා |

සමන් දර්ශන පාඩිකෝරාල
අමාත්‍ය මණ්ඩල ලේකම්
දකුණු පළාත

" විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා"

(3)


# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# ஆளுநர் செயலகம்
# GOVERNOR'S SECRETARIAT

දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.


මගේ අංකය / எனது இல / My No. } G/SP/1/6/3/8

ඔබේ අංකය / உமது இல / Your No: }

දිනය / திகதி / Date } 2018.11. 05


ලැබුණා
08 NOV 2018
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.
DF


ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

දකුණු පළාත.

**ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතන ලද ඔබේ අංක CSS/7/6/3/2 හා 2018.10.16 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2018.07.09 දිනැතිව නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 පදනම් කර ගෙන, පළාත් සභා මුදල් රීති සංග්‍රයේ රීති 422 සංශෝධනය කල ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 හි සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමාවන් පහත පරිදි සංශෝධනය කර දකුණු පළාත් සභාවට පහත පරිදි අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2018.11.01 දින ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

1. භාණ්ඩ වැඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරි ලංසු කැඳවීමේ පරිපාටිය (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1, 3.2 හෝ 3.3), සෘජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ 3.5) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීම

| බල අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්ගත කොන්ත්‍රාත්තු | |
|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200 ට වැඩි | රු.මිලියන 250 ට වැඩි |
| පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා | රු.මිලියන 200 ට වැඩි | රු.මිලියන 250 ට වැඩි |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200 දක්වා | රු.මිලියන 250 දක්වා |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා | රු.මිලියන 200 දක්වා | රු.මිලියන 250 දක්වා |

422.1 ආ: භාණ්ඩ වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳ පොළ මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4)

1. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත්තු සඳහා පහත සඳහන් අය වෙතින් මිළ ගණන් කැඳවිය හැකිය.

(අ) ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් (ප්‍රකට වෙළදුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම්)

(ආ) ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි සැපයුම්කරුවන් (අදාල වේ නම්)

2. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජාපාදක සංවිධානද ඇතුළු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිළ ගණන් කැඳවිය හැකිය.

අදදාල අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛණ භාවිතා කළ යුතුය. එසේම කලින් දැනුම් දුන් දිනෙක ලංසු භාර ගැනීම අවසන් කළ යුතු අතර එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කළ යුතුය.

| බල අධිකාරිය | විදේශ අරමුදල්ගත කොන්ත්‍රාත්තු | |
|---|---|---|
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 28 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේකය - 34 |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ (ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 2 දක්වා | රු.මිලියන 3.5 දක්වා |

ඩබ්ලිව්.යූ.පී. ප්‍රේමචන්ද්‍ර
ආණ්ඩුකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
පහළ ඩික්සන් පාර
ගාල්ල

**ඩබ්ලිව්.යූ.පී.ප්‍රේමචන්ද්‍ර**
**ආණ්ඩුකාර ලේකම්**
**දකුණු පළාත.**

Atte -: Ms. Tharindi

# Democratic Socialist Republic of Sri Lanka

## Supplement 34

**To the**

## PROCUREMENT MANUAL

**Issue Date: 09.07.2018**

**Effective Date: 09.07.2018**

**To be used along with the Government Procurement Guidelines - 2006 (Goods and Works)**

This supplement supersedes the Supplement 33 to the Procurement Manual

**Guideline Reference: 2.14.1**

**Authority limits of Procurement Committees for Contract Award Recommendation/Determination under Open Competitive Bidding Procedure (Guideline 3.1, 3.2 or 3.3), Shopping Procedure (Guideline 3.4), Direct Contracting (Guideline 3.5) or Repeat Orders (Guideline 3.6)**

**for procurement of Works, Goods and Services other than Consultancy Services**

**DEPARTMENT OF PUBLIC FINANCE**

## PROCUREMENT GUIDELINE REFERENCE: 2.14.1

## AUTHORITY LIMITS OF PROCUREEMENT COMMITTEE FOR CONTRACT AWARD RECOMMEDNATION/DETERMINATION

When Open Competitive Bidding Procedure (Guideline 3.1, 3.2 or 3.3), Direct Contracting Procedure (Guideline 3.5) or Repeat Order Procedure (Guideline 3.6) is followed for the procurement of goods, works and services other than consultancy services.

1. The total cost estimate of each procurement shall be considered is deciding the Procurement Authority;
2. In the case of rentals and leases, the contract value for the entire rental or lease period shall be considered in deciding the procurement authority.

| Authority | GOSL Funded Projects | Foreign Funded Projects |
|---|---|---|
| ~~Standing Cabinet Appointed Procurement Committee (SCAPC)~~ | ~~More than Rs. 250 Mn~~ | More than Rs.600 Mn. |
| Cabinet Appointed Procurement Committee (CAPC) | | |
| ~~Ministry Procurement Committee (MPC)~~ | ~~Up to Rs.250 Mn.~~ | Up to Rs.600 Mn. |
| Department Procurement Committee (DPC)/Project Procurement Committee (PPC) | Up to Rs.100 Mn. | Up to Rs.300 Mn. |
| Regional Procurement Committee (RPC) | Up to Rs.10 Mn. | Up to Rs.10 Mn. |

PROCUREMENT GUIDELINE REFERENCE: 2.14.1 (Cont …)

**When Shopping Procedure (Guideline 3.4) is followed for the procurement of goods, works and services other than consultancy services**

1. For supply & service contracts, quotations may be invited from:
   (a) Suppliers listed in SLT rainbow pages etc, if sufficient number of reputed vendors are listed
   (b) Suppliers registered with the Procuring Entity: if applicable
2. For construction contracts, quotations may be invited from registered contractors including Community Based Organizations (CBO)

The Procuring Entity shall use standard documents in line with the Government Procurement Guidelines, where applicable and bids shall be closed at pre-disclosed deadline and public bid opening.

| **Level of Authority** | **Minimum quotations to be invited** | **Limits of Authority** | |
|---|---|---|---|
| | | **GOSL funded (Rs. Mn)** | **Foreign Funded (Rs. Mn)** |
| MPC | **Works**<br>By inviting at least five sealed quotations | Up to 20 | Up to 20 |
| | **Goods & Services other than Consultancy Services**<br>By inviting at least five sealed quotations | Up to 12 | Up to 18 |
| | **Goods & Services other than Consultancy Services**<br>By inviting at least three sealed quotations | Up to 8 | Up to 8 |
| DPC / PPC | **Works**<br>By inviting at least five sealed quotations | Up to 10 | Up to 15 |
| | **Goods & Services other than Consultancy Services**<br>By inviting at least five sealed quotations | Up to 10 | Up to 15 |
| | **Goods & Services other than Consultancy Services**<br>By inviting at least three sealed quotations | Up to 5 | Up to 5 |
| RPC | **Works**<br>By inviting at least five sealed quotations | Up to 3.5 | Up to 3.5 |
| | **Goods & Services other than Consultancy Services**<br>By inviting at least five sealed quotations | Up to 1 | Up to 1 |
| HD / PD/ CAO | **Works**<br>By inviting at least three sealed quotations | Up to 1 | |
| | **Goods & Services other than Consultancy Services**<br>By inviting at least three sealed quotations | Up to Rs. 500,000 | |

<table>
<tr><td colspan="3">PROCUREMENT GUIDELINE REFERENCE: 2.14.1 (Cont …)</td></tr>
<tr><td colspan="3">Direct Purchase of smaller value repair works, goods and services (Guideline 3.5 and 3.6) (by GOSL funds or foreign funds)</td></tr>
<tr><th>Level of Authority</th><th>Requirements to be fulfilled</th><th>Authority Limit</th></tr>
<tr><td rowspan="3">CAO / HD / PD</td><td>Works<br>• Satisfying the requirements given under Guideline 3.5 or 3.6</td><td>Up to Rs. 500,000</td></tr>
<tr><td>Works<br>• When it is uneconomical to follow competitive procedure.<br>• CAO/HD/PD must ensure the economy of procurement.<br>• This authority should be used under the personnel supervision of CAO/HD/PD & should not be delegated to any person.</td><td>Up to Rs. 200,000</td></tr>
<tr><td>Goods & Services other than Consultancy Services<br>• Satisfying the requirements given under Guideline 3.5 or 3.6</td><td>Up to Rs. 200,000</td></tr>
<tr><td>CAO / HD / PD</td><td>Goods & Services other than Consultancy Services directly from open market<br>• When it is uneconomical to follow competitive procedure.<br>• CAO/HD/PD must ensure the economy of procurement.<br>• This authority should be used under the personnel supervision of CAO/HD/PD.</td><td>Up to Rs. 100,000</td></tr>
<tr><td>HD / PD</td><td>Repairs to motor vehicles and other equipments<br>• When it is uneconomical to follow competitive procedure.<br>• HD/PD must ensure the economy of procurement.<br>• This authority should be used under the personnel supervision of HD/PD.<br>• For repairs exceeding Rs. 200,000/- CAO's personnel approval should be obtained.</td><td>Up to Rs. 200,000</td></tr>
<tr><td rowspan="2">Regional Heads or Officers in charge of separate units who were delegated authority by HD</td><td>Goods or Services including equipment of smaller value not exceeding Rs. 15,000/- per event per day<br>• Total of such purchases during any calendar month should not exceed Rs. 60,000/-.</td><td>Up to Rs. 15,000</td></tr>
<tr><td>Repair motor vehicle to a value not exceeding Rs. 50,000/- per month</td><td>Up to Rs. 50,000</td></tr>
</table>

## AUTHORITY LIMITS FOR DEVIATING FROM PROCUREMENT PROCEDURE

When it becomes necessary to deviate from tender procedures in very urgent and exceptional circumstances with regard to procurements under funds of the Government of Sri Lanka, the following competent authorities may authorize such deviations within the limits prescribed, provided that, the reasons are explicitly recorded in writing and a copy is forwarded to the Auditor General.

| **Competent Authority** | **Authority limits for deviating from Procurement Procedure** |
|---|---|
| Head of Department<br>(His personal approval is required) | Up to Rs. 250,000 |
| Department Procurement Committee (DPC) | Up to Rs. 5 Mn |
| Ministry Procurement Committee (MPC) | Up to Rs. 10 Mn |
| Cabinet of Ministers | Above Rs. 10 Mn |

## APPROVING AUTHORITY

Before the contract is awarded approval from the following authorities (subject to the delegation of authority provided under FR 135) should be obtained for the recommendation / determination by the PCs.

| | |
|---|---|
| Regional Procurement Committee (RPC) | Head of the Department |
| Project Procurement Committee (PPC) | Chief Accounting Officer |
| Department Procurement Committee (DPC) | Chief Accounting Officer |
| Ministry Procurement Committee (MPC) | Chief Accounting Officer |
| Cabinet Appointed Procurement Committee (CAPC) | Cabinet of Ministers |

The Chief Accounting Officer (CAO) may appoint a minor committee(s) to take action on smaller value procurements within the authority limits of the MPC/DPC/PPC. Accordingly, CAO may consider changing the composition given under the Procurement Manual 2.7.4, 2.7.5 and 2.7.6.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රසම්පාදන කාර්‍ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28**

**නිකුත් කළ දිනය : 04-07-2014**

මෙම අතිරේකය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 (භාණ්ඩ සහ වැඩ) සමඟ පරිශීලනය කළ යුතු අතර ප්‍රසම්පාදන කාර්‍ය සංග්‍රහය සඳහා නිකුත් කළ අතිරේක 20 සහ 21 මෙයින් අවලංගු කරනු ලැබේ

**මාර්ගෝපදේශ යොමුව : 2.14.1**

**භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනයට අදාළ කොන්ත්‍රාත් පිරිනැමීම නිර්දේශ/නිර්ණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරි සීමාවන්**

1. විවෘත තරඟකාරි ලංසු කැඳවීමේ පරිපාටිය (මාර්ගෝපදේශ 3.1, 3.2 හෝ 3.3), ඍජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ 3.5) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6)

2. වෙළඳ පොළ මිල සැදහුම් ක්‍රමය (මාර්ගෝපදේශ 3.4) සහ ඍජු මිලදී ගැනීම් (මාර්ගෝපදේශ 3.5 සහ 3.6)

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව: 2.14.1

## කොන්ත්‍රාත් පිරිනැමීම නිර්දේශ/නිර්ණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරි සීමාවන්

භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරි ලංසු කැඳවීමේ පරිපාටිය (මාර්ගෝපදේශ **3.1**, **3.2** හෝ **3.3**), සෘජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ **3.5**) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ **3.6**) අනුගමනය කිරීමේදී :

1. ප්‍රසම්පාදන අධිකාරිය තීරණය කිරීමේදී එක් එක් ප්‍රසම්පාදනය සඳහා වන මුළු පිරිවැය ඇස්තමේන්තුව සැලකිල්ලට ගත යුතුය.
2. කුලියට දීම සහ බදු දීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අධිකාරිය තීරණය කිරීමේදී සම්පූර්ණ කුලිය හෝ බදු කාල සීමාව සඳහා කොන්ත්‍රාත්තුවේ වටිනාකම සැලකිල්ලට ගත යුතුය.

| අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව / අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 200 ට වැඩි | රු.මි. 600 ට වැඩි |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 200 දක්වා | රු.මි. 600 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව / ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 100 දක්වා | රු.මි. 300 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 10 දක්වා | රු.මි. 10 දක්වා |

**භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී (මාර්ගෝපදේශ 3.4) :**

1. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත්තු සඳහා පහත සඳහන් අය වෙතින් මිල ගණන් කැඳවිය හැකිය.

   (අ) ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් (ප්‍රකට වෙළඳුන්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැයිස්තුගත කර ඇත්නම්)

   (ආ) ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි සැපයුම්කරුවන් (අදාළ වේ නම්)

2. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජාපාදක සංවිධානද ඇතුළු ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවිය හැකිය.

අදාළ අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සකසන ලද සම්මත ලිපි ලේඛන භාවිතා කළ යුතුය. එසේම කලින් දැනුම් දුන් දිනක ලංසු භාර ගැනීම අවසන් කළ යුතු අතර එම ලංසු ප්‍රසිද්ධියේ විවෘත කළ යුතුය.

| අධිකාරිය | කැඳවිය යුතු අවම මිල ගණන් ප්‍රමාණය | අධිකාරි සීමාව (රු.මි.) | |
|---|---|---|---|
| | | ශ්‍රී ලංකා රජයේ අරමුදල් | විදේශ අරමුදල් |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | වැඩ - මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 20 දක්වා | 20 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 12 දක්වා | 18 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 3 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 8 දක්වා | 8 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව / ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | වැඩ - මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 10 දක්වා | 15 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 10 දක්වා | 15 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 3 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 5 දක්වා | 5 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | වැඩ - මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 2 දක්වා | 2 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 5 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 1 දක්වා | 1 දක්වා |
| ත.ග.නි. / දෙ.ත. / ව්‍යා.ප. | වැඩ - මුද්‍රා තැබූ මිල ගණන් 3 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | 1 දක්වා | |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා - මුද්‍රා තැබූ මිල ගණන් 3 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.500,000 දක්වා | |

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව: 2.14.1 (සබැඳි) | | |
|---|---|---|
| සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිලදී ගැනීම් (මාර්ගෝපදේශ 3.5 හෝ 3,6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන) | | |
| අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | අධිකාරි සීමාව |
| ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර. / ව්‍යා.අ. | වැඩ<br>• මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන | රු. 500,000 දක්වා |
| | වැඩ<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායි බව පිළිබඳව ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර. / ව්‍යා.අ. සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර. / ව්‍යා.අ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර වෙනත් පුද්ගලයෙකු වෙත නොපැවරිය යුතුය. | රු. 200,000 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා<br>• මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන | රු. 200,000 දක්වා |
| ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර. / ව්‍යා.අ. | සෘජුවම වෙළඳ පොළෙන් භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායි බව පිළිබඳව ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර. / ව්‍යා.අ. සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර. / ව්‍යා.අ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය. | රු. 100,000 දක්වා |
| දෙ.ප්‍ර. / ව්‍යා.අ. | මෝටර් රථ සහ වෙනත් උපකරණ අළුත්වැඩියාව<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායි බව පිළිබඳව දෙ.ප්‍ර. / ව්‍යා.අ. සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය දෙ.ප්‍ර. / ව්‍යා.අ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය..<br>• රු. 200,000/- ඉක්මවන අළුත්වැඩියාවන් සඳහා ප්‍ර.ග.නි. ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු. 200,000 දක්වා |
| දෙ.ප්‍ර. විසින් අධිකාරි බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාළ ඒකක/අංශ භාරව කටයුතු කරන නිලධාරීන් | එක් දිනකදී එක් කටයුත්තක් සඳහා රු. 15,000/- නොඉක්මවන පරිදි සුළු වටිනාකම්වලින් යුත් උපකරණද ඇතුළු භාණ්ඩ හා සේවා මිලදී ගැනීම<br>• එක් ලිත් මාසයක් තුළ සිදුකරන එවැනි මිලදී ගැනීම්වල එකතුව රු. 60,000/- නොඉක්මවිය යුතුය. | රු. 15,000 දක්වා |
| | මසකට රු. 50,000/- නොඉක්මවන මෝටර් වාහන අළුත්වැඩියා කිරීම | රු. 50,000 දක්වා |

66

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව: 2.14.1 (සබැඳි) |
|---|
| ප්‍රසම්පාදන කාර්ය පරිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරි සීමාවන් |
| ශ්‍රී ලංකා රජයේ අරමුදලින් කරන ප්‍රසම්පාදනවලට අදාළව ඉතා හදිසි වූ සහ ඉතා විශේෂ වූ කරුණු හේතුවෙන් නියමිත ප්‍රසම්පාදන කාර්ය පරිපාටියෙන් බැහැරවීම අවශ්‍ය වන විට, පහත නියම කර ඇති සීමාවන්ට යටත්ව ඒ සඳහා බලය දීමට නිසි අධිකාරියට හැකිය. එවන් අවස්ථාවලදී ඊට හේතු පැහැදිලිව ලිඛිතව වාර්තා කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතුය. |

| නිසි අධිකාරිය | ප්‍රසම්පාදන කාර්ය පරිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරි සීමාවන් |
|---|---|
| දෙපාර්තමේන්තු ප්‍රධානියා (ඔහුගේ පෞද්ගලික අනුමැතිය ලැබිය යුතුය) | රු. 250,000 දක්වා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 5 දක්වා |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 10 දක්වා |
| අමාත්‍ය මණ්ඩලය | රු.මි. 10 ට වැඩි |

| අනුමත කිරීමේ අධිකාරිය | |
|---|---|
| කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර, ප්‍රසම්පාදන කමිටු විසින් කර ඇති නිර්දේශ/ නිර්ණයන් සඳහා පහත සඳහන් අධිකාරීන්ගේ (බලය පැවරීම සම්බන්ධයෙන් මු.රෙ. 135 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව) අනුමැතිය ලබා ගත යුතුය. | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා |
| අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව | අමාත්‍ය මණ්ඩලය |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු/ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු/ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු අධිකාරි සීමාවන් තුළ පහළ වටිනාකම් සහිත ප්‍රසම්පාදන කටයුතු සඳහා සුළු කමිටුවක්/කමිටු පත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හැකිය. එවිට ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.7.4, 2.7.5 හා 2.7.6 යටතේ සඳහන් කමිටු සංයුතිය වෙනස් කිරීමටද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හැකිය. | |